www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ලෝක ආර්ථිකය නිදහසේ කඩාවැටේ

## World economy in freefall

අන්ද්‍රෙ ඩේමන් විසිනි.

2009 මැයි 22

ආර්ථික අර්බුදයේ යථා නිර්නායක දිගින් දිගටම නරක අතට ගමන් ගන්නා අතර ම, ලෝකයේ ප්‍රධාන පෙලේ ආර්ථිකයන්ට හිමිකම් කියන රජයන් පසුගිය දින වලදී පලමු කාර්තුවේ තියුනු හැකිලීම් නිවේදනය කලහ.

ගිය වසරට සාපේක්ෂව තම ආර්ථිකය සියයට 8.2 කින් හැකිලී ගිය බව බදාදා නිවේදනය කරමින්, පලමු කාර්තුවේ දැවැන්ත බැස්මක් ගැන සඳහන් කල නවතම රට මැක්සිකෝවයි. රට බංකොලොත්භාවයේ අන්තයට ම ගෙන ගිය 1995 පෙසෝ අර්බුදයෙන් පසුව සිදුවූ දැවැන්තම කඩාවැටීම මෙය වන අතර වාර්ෂික පදනමක් මත සියයට 21.5 ක නිදහස් කඩාවැටීමක් සඳහා තතු සැකසෙමින් තිබේ.

1955 පටන් දරුනුතම පහලයාම සහ තැති ගන්වන සුලු වාර්ෂික සියයට 15.2 ක හැකිලීමක් සහිතව, ජපාන ආර්ථිකය හතරවැනි කාර්තුවේදී සියයට 4 කින් හැකිලුන බව අගහරුවාදා නිවේදනය කෙරිනි. කලින් කාර්තුවේදී ජපාන ආර්ථිකය සියයට 3.8 කින් හැකිලී තිබිනි.

1970 දී රජය විසින් පටන් ගැනුනු කාර්තුවෙන් කාර්තුවට අගයයන් තබාගැනීමේ සිට ඇති වූ, අති තියුනු වූ හැකිලීම වන, පලමු කාර්තුවේදී සියයට 4 කින් තම ආර්ථිකය කඩා වැටීම, ගිය සතියේදී ජර්මනිය නිවේදනය කලේය. සැලකිය යුතු කඩාවැටීම් සහිත සෑම යුරෝපීය ආර්ථිකයන්ගෙන් ම වඩා දරුනු ලෙසට පහර වැදුනු එකම ආර්ථිකය, බාහිර ඉල්ලුම මත වැඩිකොට රඳුනු, ජර්මානු ආනයන-ප්‍රමුඛ ආර්ථිකයයි.

පහල බැසීම ආපසු හැරීමේ ලක්ෂ්‍යය දක්වා ලඟා වී ඇති බව, ආර්ථික සහයෝගය සහ සංවර්ධනය සඳහා වන සංවිධානය වෙනුවෙන් යුරෝපීය මහ බැංකුවේ සභාපති ෂෝන් ක්ලෝඩ් ට්‍රයිචෙට් පැවසුවේ පසුගිය සඳුදාය. කොටස් වෙලඳපොල ක්‍රියාකාරිත්වය සහ විශ්වාසනීය සංඛ්‍යා මත බොහෝ සේ රඳුනු ට්‍රයිචෙට් ඉහල නැගීමක් අද්දරට පැමින ඇති බවට ඉඟි කලේය.

"සෑම ආර්ථිකයකම දල දේශීය නිෂ්පාදිතය (දදේනි) පහලයෑම අඩුවෙමින් පවතින බව අපට පෙනේ. සමහර ඒවා දැනටමත් යථා තත්වයට පත් වෙමින් තිබේ." ට්‍රයිචෙට් නිගමනය කලේය. නවතම දදේනි සංඛ්‍යා කෙසේවත් මෙම පුරෝකථනයට විශ්වාසනීයත්වයක් අත්කර නොදේ.

සිකුරාදා ඉදිරිපත් කෙරුනු නිල සංඛ්‍යා යුරෝ කලාපයේ පලමු කාර්තුව තුල හැකිලීම, 2008 අවසාන කාර්තුවේ සියයට 1.5 ක හැකිලීම හා සසඳන විට සියයට 2.5 ක් බව පෙන්නුම් කරයි.

ඉදිරිපත්ව ඇති සංඛ්‍යා ප්‍රබලය. *ෆයිනෑන්ෂල් ටයිම්ස්හි* ලෙක්ස් කොලම පෙන්වා දෙන අන්දමට "මෙම රේට්ටුවෙන් දිගටම ජර්මානු ආර්ථිකය හැකිලේ නම්, වසර අවසානයේදී එය පස්වැන්නා බවට කුඩා වනු ඇත. මෙය දශකය සම්පූර්නයෙන්ම ආපසු හැරවීමක් වන අතර ඒකාබද්ධවීමේ සිට වර්ධනය අඩක් බවට පත් වනු ඇත."

යුරෝපීය සංගමයේ (යුස) නවතම සාමාජිකයා වන ස්ලෝවැකියාවේ ආර්ථිකය, වසරේ පලමු මාස තුන ඇතුලතදී, සියයට 11.2 කින් හැකිලීම පෙන්නුම් කරන නවතම සංඛ්‍යාලේඛනවලට අනුව, නැගෙනහිර යුරෝපයේ ආර්ථිකයන් කුඩු පට්ටම්වෙමින් තිබේ.

මෙක්සිකෝව, ජර්මනිය, සහ ජපානය එක්සත් ජනපදයේ විශාලතම වෙලඳ කොටස්කරුවන් වන අතර, එක්සත් ජනපදය සමග ඔවුහු ඒකාබද්ධව වාර්ෂිකව ඩොලර් ට්‍රිලියන භාගයක වෙලඳමක් සිදු කරති. පහලයෑමට පෙරාතුව, ඇමෙරිකානු ආනයන වසරකට ඩොලර් ට්‍රිලියන තුනකට ආසන්න වූ අතර, විදේශ නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රධානතම මෙහෙයුම් බලය ලෙස ස්ථාපිත වී තිබිනි.

*වෝල් ස්ට්‍රීට් ජර්නලයට* අනුව, ගිය වසර හා සැසඳීමේදී, 2009 වසරේ පලමු කාර්තුවේදී වෙලඳ

භාන්ඩ ආනයනය සියයට 30 කට වඩා පහත වැටී ඇත. 2006 දී එක්සත් ජනපදයේ ජංගම ගිනුමේ හිඟය ඩොලර් බිලියන 800 කට වැඩි වූ අතර එය දැන් ඩොලර් බිලියන 500 දක්වා අඩු වී තිබේ. විරැකියා මට්ටම ඉහලයාම, නිවාස මිල පහල බැසීම, සහ දැවැන්ත උකස් නොගෙවීම් විසින් පැන නැගුනු වාතාවරනය, වාහන සහ පාරිභෝගික භාන්ඩ ඇතුලත්ව විදේශ භාන්ඩ පරිභෝජනය සැලකිය යුතු ලෙස පහල යාමකට තුඩු දී ඇත. *වෝල් ස්ට්‍රීට් ජර්නලයට* අනුව, තම නිෂ්පාදනයෙන් වැඩි කොටසක් එක්සත් ජනපද වෙලඳපොලට යවන, මැක්සිකානු වාහන නිෂ්පාදනය සියයට 41 කින් කඩා වැටී තිබේ.

අන්තර්ජාතික නිෂ්පාදනයේ සංකීර්න ජාලය, ආර්ථික පහලයෑම නිසා කුඩු පට්ටම් වී ඇති බැවින්, ගෝලීය සැපයුම් දාමයේ නිෂ්පාදකයින්, තමන් කොතරම් නිෂ්පාදනය කල යුතු ද යන තොරතුරු වලින් සම්පූර්නයෙන්ම කපා හැර ඇත.

*වෝල් ස්ට්‍රීට් ජර්නලය* විසින් සම්මුඛ සාකච්ඡාවකට බඳුන් කල ඉලෙක්ට්‍රොනික උපාංග නිපදවන්නෙක් පැවසුයේ, "කිසිවෙක් කිසිවක් නොදන්නා බැවින් කිසිදු තොරතුරක් නොමැතිව ඔබට ඇත්තටම යම්කිසි ප්‍රමානයක් තෝරා ගැනීමට සිදු වී තිබේ." ජපාන නිෂ්පාදනවල කඩාවැටීම නිවේදනය කිරීමෙන් පසුව අඩුවූ ඉල්ලුමට ප්‍රතිකාරයක් ලෙසට තම ගෝලීය සැපයුම් ජාලය අඩකින් කපා හරින බව සෝනි පැවසීය.

බදාදා එක්සත් ජාතීන් විසින් ප්‍රසිද්ධ කරන ලද වාර්තාවකට අනුව, ගිය වසරේදී විදේශීය සෘජු ආයෝජන සියයට 15 කින් හැකිලී තිබේ. ගිය වසරට වඩා විදේශ ආයෝජනවල බැස්ම වඩාත් ගැඹුරු විය හැකි බව වෙලඳාම සහ සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ සම්මේලනයේ (අන්ක්ටාඩ්) මහ ලේකම් සුපචායි පනිච්පක්ඩි පැවසීය.

මේ අතර ගෝලීය කොටස් වෙලඳපල සහ මූල්‍යමය ලාභ නැවත ප්‍රකෘති තත්වයට පත්වෙමින් තිබේ. පසුගිය මාස තුනෙහි දී සෑම ප්‍රධාන ලෝක කොටස් අගයයන් ශීඝ්‍රලෙස ඉහල නැගිනි. මාර්තුවේ සිට එෆ්ටීඑස්ඊ සමස්ත ලෝක අගය සියයට 40 කින් ඉහල ගොස් ඇත.

ගිය මාස තුන පුරාවට එක්සත් ජනපද නැස්ඩැක් අගය සියයට 16.88 ක වැඩිවීමක් ලැබ ඇති අතර යුරෝපයේ එෆ්ටීඑස්ඊ යුරෝ ෆස්ට් සියයට 18 කින්, ජපාන නික්කෙයි සියයට 24.91 කින්, සහ තායිවාන හැන් සෙන් 35.44 කින් ඉහල ගොස් තිබේ. මේ අතර වැන්ගාඩ් මූල්‍යමය දර්ශකය, මේ සියල්ලම අභිබවා, මාර්තු 6 සිට සියයට 42 කින් පිම්මක් පැන තිබේ.

බ්‍රහස්පතින්දා *ෆයිනෑන්ෂල් ටයිම්ස්හි* කොලමක් පෙන්වාදෙන අන්දමට, ලෝකය පුරා මහ බැංකු විසින් ඩොලර් ට්‍රිලියන ගනනක් මුදල් හුවමාරුව පිනිස පොම්පකිරීම සහ කොටස් වෙලඳපල ප්‍රකෘති තත්වයට පත්වීම අතර සම්බන්ධතාවයක් තිබේ. "ආන්ඩු සහ මහ බැංකු විසින් මුදාහැරුනු මුදල් කන්දරාවෙන් වෙලඳපල ඉතිරියමින් තිබීම, වසර දෙකකට පෙර අගයයන්ට වඩා වැඩි අගයයන්ට රැගෙනයාම කරා යලි ඇති වන සමපේක්ෂනයන්ට හේතුවිය. එක් අවස්ථාවකදී මෙම තත්වය වියලී යා හැක..... බලාපොරොත්තුව කෘතිම නම් ඒවා බිඳ වැටීම යථාර්තයක් විය හැක."

මෑතක නිකුත් කෙරුනු ඩොයිෂ් බැංකු වාර්තාවකට අනුව, එක්සත් ජනපදය පමනක් ඩොලර් ට්‍රිලියන 15 ආසන්න මුදලක් මූල්‍ය පද්ධතියට පොම්ප කිරීමට නියමිත ය. 1930 ගනන් මෙපිට සිදුවූ දැවැන්තම සුන්නත්දූලියන් තුල යථා ආර්ථිකයන් පෙලෙන අතරේදී, ප්‍රසිද්ධ නොකරන මුදල් ට්‍රිලියන ගනන් පොම්පකරමින්, ප්‍රධාන සංවර්ධිත රටවල් සමාන ක්‍රියාමාර්ග ගෙන ඇත.

ඔබාමා පරිපාලනයේ වැඩ සටහන වන නෙරපීම් හා ප්‍රතිව්‍යුහගතකරනය තුලින් වැඩ කරන ජනතාව දුක්ඛිතභාවයට ඇදදමන අතරේ මූල්‍ය ආයතනවලට දැවැන්ත සහන සැලසීම, සීමා සහිතව, සියලු සංවර්ධිත රටවල ආන්ඩුවල මෙහෙයුම් ක්‍රියාවලිය වී තිබේ. මෙය එක්සත් ජනපදය, ස්පාඤ්ඤය සහ එක්සත් රාජධානිය වැනි ඉහල අන්තර්ජාතික හිඟයන් ඇති රටවල දී, විදේශවලට හැකිලීම් මාරුකර යැවීමට බලපෑ හැක.

නමුත් අතිරික්ත සහිත රටවල් තව දුරටත් තාර්කිකව ප්‍රතිචාර දැක්වීම නොකරති. බීජිංහි පීකිං විශ්ව විද්‍යාලයේ මූල්‍ය කටයුතු පිලිබඳ මහාචාර්ය මයිකල් පෙටිස්, බ්‍රහස්පතින්දා *ෆයිනෑන්ෂල් ටයිම්ස්හි* ලියන අන්දමට, කාර්මික නිෂ්පාදනය ඉහල නංවමින් බැසයන ලෝක ඉල්ලුම වෙනතකට හරවන්නට ආසියානු අපනයනකරුවන්, විශේෂිතව ම චීනය, උත්සාහ දරමින් සිටී.

"නිෂ්පාදනය ඉහල නංවන මෙම ආයෝජන-මූලික ප්‍රතිපත්ති, පරිභෝජනය වක්‍ර ලෙසට ඉහලනංවන අතර, එමගින් වර්ධනය තාවකාලිකව ඉහල ගියත් ඇමෙරිකානු මිලදීගැනීම්වලට ආදේශකයක් වන්නට, දේශීය දල පරිභෝජනය සතුටුදායක මට්ටමකින් විශාල වැඩිවීමකට හේතු විය නොහැක. වඩාත් නරකම දෙය විය හැක්කේ, සමහර අවස්ථාවලදී මෙම ප්‍රතිපත්ති අනාගත දේශීය පරිභෝජනය, වඩාත් අවශ්‍යම මොහොතේදී, උග්‍ර ලෙස සීමාකරවිය හැකි බවයි."

කෙටියෙන් කිවහොත්, දශ ලක්ෂ ගනනක් දුක්ඛිතභාවයට ඇදදමමින් හා එහි ප්‍රතිපල ලෙස ජංගම ගිනුම් හිඟයේ අඩුවීමක් හරහා දැවැන්ත ලාබ උපැයීමක් කරා ආපසු යන්නට එක්සත් ජනපද ප්‍රභූවට අවශ්‍ය වන අතරේදී, චීනය තිරසාර නොවන නිෂ්පාදන ධාරිතාවක් ගොඩනැගීම හරහා ලාභ ප්‍රකෘතිභාවයට පත්කරන්නට මාන බලමින් සිටී. මෙම ප්‍රතිපත්ති දෙක ගැටෙන මාර්ගයක යන්නේ නමුත් ඒවායේ අන්‍යොන්‍ය ප්‍රථිපලය එකම වනු ඇත. එනම් ආනයනික රටවල්වල කම්කරුවන් දුක්ඛිතභාවයට ඇදදැමීම සහ අපනයන රටවල්වල දැවැන්ත විරැකියා මට්ටම්, අධිධාරිතාවන් හා ගැඹුරුවන ආර්ථික අර්බුදයන්ය.

නිදහසේ කඩා වැටෙන ලෝක ආර්ථිකය සහ ශ්‍රීඝ්‍රයෙන් ඉහල නගින විරැකියා තත්වය තුල වර්ධනය වන මෙම ක්‍රමවේදයන්, සමස්ත ලෝකය පුරාම සමාජ නැගිටීම්වලට ඉවහල් වනු ඇත.

© www.wsws.org